# ප්‍රධාන ලේකම් කාර්යාලය - මධ්‍යම පළාත

## ලංසු ආරාධනය

### ශබ්ද පරිවාරක ආවරණය සහ ATS පැනලය සහිත 50kVA (-5% සිට +10% දක්වා) විදුලි ජනක යන්ත්‍රයක් (50kVA(- 5% සිට +10%) Generator with canopy and ATS Panel) සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

01. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ කළමනාකරණ සංවර්ධන පුහුණු ඒකකය සඳහා **ශබ්ද පරිවාරක ආවරණය** සහ ATS පැනලය සහිත 50kVA (-5% සිට +10% දක්වා) විදුලි ජනක යන්ත්‍රයක් (50kVA(-5% to +10%) Generator with canopy and ATS Panel) සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| විස්තරය | අවශ්‍ය ඒකක ප්‍රමාණය | ලංසු ඇපකරය (2026.03.03 දක්වා වලංගු විය යුතුය) රු. | ලංසු ලියවිලි ගාස්තුව රු. |
|---|---|---|---|
| ශබ්ද පරිවාරක ආවරණය සහ ATS පැනලය සහිත 50kVA (-5% සිට +10% දක්වා) විදුලි ජනක යන්ත්‍රය | 01 | 150,000.00 | 2,000.00 |

02. ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු කැඳවීමේ (NCB) ක්‍රමවේදයට සිදු කෙරේ.

03. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය මඟින් නිකුත් කරනු ලබන ලංසු ලියවිලි මඟින් ලංසු ඉදිරිපත් කළ යුතු අතර ඉහත වගුවේ සඳහන් පරිදි ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තු මුදලින් ගෙවීමෙන් පසු අදාළ ලංසු ලියවිලි මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (මුදල්) වෙතින් 2025.11.04 සිට 2025.11.17 දින දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා අතර කාලය තුළ ලබා ගත හැක.

04. නිසි ලෙස පුරවන ලද ලංසු ලේඛනය **"මුල් පිටපත"** සහ **"අනු පිටපත"** ලෙස සලකුණු කර ඇති මුද්‍රා තැබූ ලියුම් කවර දෙකක බහා එම කවර දෙක නැවත ඉහළ වම් කෙළවරේ **" මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා ශබ්ද පරිවාරක ආවරණය සහ ATS පැනලය සහිත 50kVA (-5% සිට +10% දක්වා) විදුලි ජනක යන්ත්‍රයක් (50kVA(-5% to +10%) Generator with canopy and ATS Panel) සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන ලංසුව - CSPC/2025/NCB/01 "** යනුවෙන් සඳහන් කළ මුද්‍රා තැබූ ලියුම් කවරයක බහා 2025.11.18 දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර, ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන පරිදි හෝ කුණ්ඩසාලේ පල්ලේකැලේ මධ්‍යම පළාත් සභා සංකීර්ණයේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිහිටි අධ්‍යක්ෂ (මුදල්) කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. සම්පූර්ණ කරන ලද ලංසුපත් සමග ඉහත වගුවේ සඳහන් වටිනාකමට මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් නමින් වගුවේ සඳහන් කාලසීමාවකට වලංගුවන පරිදි ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතු අතර, එය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මහ බැංකුවේ අනුමත දේශීය හෝ විදේශීය වාණිජ බැංකුවකින් ලබාගත් ඇපකරයක් හෝ මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් වෙත මුදලින් ගෙවා ලබාගත් රිසිට්පතක් මඟින් විය යුතුය.

06. ලංසු විවෘත කිරීම 2025.11.18 දින ප.ව.2.30 පසුවනවාත් සමග මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) නිල කාමරයේ දී සිදු කරන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

07. මේ සම්බන්ධව පූර්ව ප්‍රසම්පාදන රැස්වීමක් 2025.11.11 දින පෙ.ව.11.00ට මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) නිල කාමරයේ දී පැවැත්වෙන අතර ඒ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ප්‍රධාන ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ (මුදල්) ගේ දුරකථන අංක **081-2424694** මඟින් විමසා දැනගත හැකි අතර ලංසු ලියවිලි **2025.11.04 දින සිට 2025.11.17** දින දක්වා රජයේ වැඩකරන දින වල ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.

09. ඉදිරිපත් කරනු ලබන ලංසු සම්පූර්ණයෙන් පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

**සභාපති,**
**ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව**
**ප්‍රධාන ලේකම් කාර්යාලය,**
**පළාත් සභා සංකීර්ණය,**
**පල්ලෙකැලේ, කුණ්ඩසාලේ.**
**2025.11.04**
**දුරකථන / ෆැක්ස් අංක - 081-2424694/081-2424692**

CamScanner